212133



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**උපදෙස් :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළ අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** එක් වර ම සභාව **නියට පිම්බාක් මෙන්** විය.
(1) තැනින් තැනින් ඉතා සුළු ශබ්ද මතු වූවාක් මෙන්
(2) කිසිදු ශබ්දයකින් තොර වූවාක් මෙන්
(3) කිහිප දෙනකු කතා කරද්දී අනික් අය නිහඬ වූවාක් මෙන්
(4) ඉහළට ඇද ගත් හුස්ම පහළට නොදමන්නාක් මෙන්

**2.** පොලිස් නිලධාරියා දුටු වහා ම සොරා **ගල් ගැසුණේ ය.**
(1) හිස නමා ගෙන සිටියේ ය.
(2) බිමට නැමී සිටියේ ය.
(3) නො සෙල්වී සිටියේ ය.
(4) දෑත නො සෙල්වූයේ ය.

**3.** ජයග්‍රාහකයා **ඉහ වහා ගිය සතුටින්** මල්වරසන් දුන්නේ ය.
(1) ඉහවත් උඩින් ගිය සන්තෝෂයෙන්
(2) සියල්ලන් පරදවන සතුටකින්
(3) සතුටු සහගත සිනින්
(4) අධික වූ සන්තෝෂයෙන්

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** රටක ආර්ථිකය කඩා වැටීම ඒ රටෙහි ............................ හානිකර ය.
(1) ස්ථාවරත්වයට (2) අස්ථාවරත්වයට (3) ප්‍රමුඛත්වයට (4) සුන්දරත්වයට

**5.** මේ පොත තමා විසින් ම ලියන ලද හෙවත් ............................ චරිත කථාවකි.
(1) ස්වයං භාෂිත (2) ස්වයං නිර්මිත (3) ස්වයං ජනිත (4) ස්වයං ලිඛිත

**6.** 'ඍ' යන අක්ෂරය සිංහල භාෂාවෙහි ............................ යෙදේ.
(1) අවිශේෂයෙන් (2) දුර්ලභ ව (3) සුලභ ව (4) නිරන්තරයෙන්

[දෙවැනි පිටුව බලන්න.

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) මිණිමෙවුළ, හොබින, භීෂණය, දළඹු
   (2) දෝලනය, ඡේදය, ගුරුලා, ගිනුම
   (3) කොළය, පර්යේෂණ, නිගණ්ඨ, සත්වල
   (4) ප්‍රශාන්ත, ආශ්චර්ය, සැණකෙළි, අනබෙරය

8. පිපි, තෙත්ත, තුඹියා, සාගරය යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල, දිගු පාපිල්ල, කොම්බුව
   (2) දිගු පාපිල්ල, කොම්බුව, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල
   (3) ඇලපිල්ල, දිගු පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කොම්බුව
   (4) කෙටි ඉස්පිල්ල, කොම්බුව, දිගු පාපිල්ල, ඇලපිල්ල

9. 'තනතුර' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
   (1) දන්තජ හා මූර්ධජ ය.
   (2) දන්තජ හා ඕෂ්ඨජ ය.
   (3) තාලුජ හා දන්තජ ය.
   (4) තාලුජ හා මූර්ධජ ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) අඹ, අන්නාසි, අනෝදා, ඇපල්
   (2) පේර, රඹුටන්, දෙළුම්, පැපොල්
   (3) දිවුල්, නාරං, වරකා, හිඹුටු
   (4) උගුරැස්ස, කෙසෙල්, මිදි, දොඩම්

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   (1) ඇතින්නක, මුගටියන්, සිංහයෝ, වඳුරා
   (2) තිත්පුවක, යාචකයන්, ළදරුවෙක්, වලසෙක්
   (3) කුකුළියෙක්, මානවයෙක්, සිවුපාවකු, රජකු
   (4) කුරුල්ලකු, කිකිළියන්, වඳුරකු, ගුරුවරුන්

12. 'විදේශ සංචාරකයෝ දුම්රියෙන් බදුල්ලට යති' යන වාක්‍යයෙහි '**දුම්රියෙන්**' යන්නෙහි විභක්තිය කුමක් ද?
   (1) කරණ (2) අවධි (3) කර්තෘ (4) සම්බන්ධ

13. 'යකඩදොර' යන්න අයත් වන්නේ,
   (1) අන්‍යාර්ථ සමාසයට ය.
   (2) විශේෂණ සමාසයට ය.
   (3) අව්‍යය සමාසයට ය.
   (4) විභක්ති සමාසයට ය.

14. 'සුන්දර + ය' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   (1) සුන්දරය (2) සෞන්දර්ය (3) සෞන්දර්‍ය (4) සෞන්දරය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
   (1) කෘදන්ත - දුවන, පනින, නටන, ගයන
   (2) තද්ධිත - බලවත්, සිල්වත්, ඉසුරුමත්, අසිරිමත්
   (3) මිශ්‍ර ක්‍රියා - කරමින්, දමමින්, ලියමින්, බලමින්
   (4) නිපාත - දක්වා, පටන්, මෙන්, සෙන්

16. **අසම්භාවන ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
   (1) දරුවා අඬ අඬා දිවුවේ ය.
   (2) මහිය, එහා ගමට යව.
   (3) ඔවුන් වැඩ කරද්දී අපි බලා සිටියෙමු.
   (4) තරුණිය සිනා සී පෙර මගට ආවා ය.

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල **තද කළ අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. ඇයගේ **මන්දස්මිතය** කෙරෙහි ඔහුගේ සිත ඇදී ගියේ ය.
   (1) පිරුණු සිනහව
   (2) මඳ සිනහව
   (3) ළගන්නා සිනහව
   (4) සුන්දර සිනහව

[තුන්වැනි පිටුව බලන්න.

18. නිවේදකයාගේ **කර්ණකටෝර** ශබ්දය මොහොත් දෙනාගේ කනාමනට ලක් විය.
(1) කනට ඉමිහිරි
(2) කන්කලු වූ
(3) කන් පිනා යන
(4) කනට අමිහිරි

19. **සුවාසුදහසක්** යොදුන් දුර ඇත්තේ ය.
(1) අසූ දහසක්
(2) අසූ දහස් හතරක්
(3) අසූහාර දහසක්
(4) අසූහාර දහස් හතරක්

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවතින** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) උදැල්ල, නඟුල, හිරමනය, දැකැත්ත
(2) ළිඳ, වතුර, බාල්දිය, කඹය
(3) මාලය, මුද්ද, වළල්ල, කරාබුව
(4) කෝප්පය, ජෝග්ගුව, කේතලය, හැන්ද

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | මුහුද - සිඳු, | මිතුරු - පසමිතුරු, | වතු - රවුම්, | අත - බාහු |
| (2) | අග්නි - ගිනි, | හාසය - හැහැය, | භූමි - පොළොව, | තාරකා - තරු |
| (3) | පුස්තක - පොත, | ඥාති - නෑ, | වෘක්ෂ - ශාඛා, | පියා - පුමිත |
| (4) | ගිරි - පර්වත, | නාග - නා, | කේශ - රෝම, | ප්‍රාකාර - අගල |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සිංහ - සිහ, මාගරාජ්, බාපුරු, මිගිඳා
(2) වනය - කැලය, වනාන්තරය, අටවි, භූකලාන
(3) ගවයා - වෘෂභ, ගොනා, හරකා, මෘග
(4) කිරණ - රශ්මි, කාන්ති, රැස්, කැන්

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) මධුර - සුමධුර
(2) සරල - සංකීර්ණ
(3) දේශීය - විදේශීය
(4) ආගමන - විගමන

24. **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'එම්බල' යනු ආමන්ත්‍රණාර්ථයෙහි නිපාතයකි.
(2) 'නුඹ' යන්න මධ්‍යම පුරුෂ, ඒක වචන නාම පදයකි.
(3) 'ය, ර, ල, ව' යනු අන්තස්ථාක්ෂර ය.
(4) 'නරියෙක්' යන්නෙහි අනුක්ත රූපය 'නරියා' යන්න යි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) තැනිතලා, කඳු මුදුන් පසු කර යන ගංගා ජලය ආරම්භයේ දී ම සමුද්‍රයට එක් වේ.
(2) පාඨශාලා අධ්‍යාපනයේ මුඛ්‍ය ප්‍රතිලාභ අත්කර ගනුයේ ශිෂ්‍යයන් නො ව ගුරුවරුන් ය.
(3) මානව වර්ගයාගේ උන්නතිය සඳහා ප්‍රබුද්ධ මනසක් ද නිරෝගී ශරීරයක් ද අවශ්‍ය ය.
(4) ජලභීතිකා රෝගය නිසා සුනඛයන් පමණක් මරණයට පත් වනු දැක ගත හැකි ය.

- අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. උගතුන් නැති තැන, මදක් ඉගෙන ගත් තැනැත්තා ද උගතකු වශයෙන් පිළිගැනෙන බව
(1) ගුලා නැති වළට කණයා පණ්ඩිතයා ලු.
(2) ඉස්සෙල්ල ආපු කනට වඩා පස්සෙ ආපු අඟ ලොකු ලු.
(3) නටන්න බැරි මිනිහට පොළොව ඇදයි ලු.
(4) නිවට කරනවැමියා දැක්ක ම එළුවත් රැවුල පානව ලු.

27. සිතෙහි හටගත් කෝපය නිසි අයුරින් නොව වෙනත් ක්‍රමයකින් පිටකර හැරීම
(1) ගම්රාල සිල් ගත්තා වාගේ
(2) ඉබ්බාගෙන් පිහාටු ගන්නවා වාගේ
(3) ගලෙන් පට්ටයක් ගන්නා වාගේ
(4) මුවහමට තඩි බාන්නා වාගේ

28. ස්වර සන්ධියට හා පූර්ව රූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) තම්මල, උනුන්
(2) උනුන්, තම්මල
(3) උනුන්, අද්දැකීම
(4) අද්දැකීම, තම්මල

- අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) සැමට සමාන ව සලකන උත්තමයකු බිහි වේවා!
(2) ගුරුවරු දරුවන්ගේ අනාගත යහපත වෙනුවෙන් වැඩ කළ යුතු ය.
(3) බොහෝ බුද්ධිමත්හු සැදැහැවත්හු නො වෙති.
(4) ශ්‍රී ලංකාව නොහොත් ඉන්දියන් සාගරයේ මුතු ඇටය අසිරිමත් දිවයිනකි.

30. (1) අක්කා ද මල්ලී ද මම ද පොත් පාඩම් කරමු.
(2) නගරාධිපති බලවතෙක් ද ධනවතෙක් ද ගුණවතකු ද වූයේ ය.
(3) ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව මෙවර තරගයට ඉදිරිපත් වන්නේ ය.
(4) දරුව, නිවටයෙක් සේ වැඩ නො කරව' යි තාපසයා කී ය.

31. - දානපතියා අසරණයන්ට සැලසුවේ පින් .............................. ය.
- මෙහි ගැහැනු ළමයින්.............................. නවාතැන් පහසුකම් ඇත.
- ඒ ඉඩම් වෙන්දේසිය .............................. නගරාධිපතිගේ ප්‍රසාදයක් නො වී ය.
- දේශකයා සම්මන්ත්‍රණය පැවැත්වූයේ දෙමාපියන් .............................. ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) ගැන, අරබයා, සඳහා, පිණිස
(2) අරබයා, ගැන, සඳහා, පිණිස
(3) පිණිස, සඳහා, ගැන, අරබයා
(4) සඳහා, ගැන, පිණිස, අරබයා

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"ඉලංදාරියා හැමදාම හැන්දෑ ජාමෙට වහං වෙනවා"
(1) තරුණයා සැම දිනක ම හවසට සැඟවුණේ ය.
(2) තරුණයා සැමදා ම රාත්‍රියෙහි සැඟවෙන්නේ ය.
(3) තරුණයා සැම දවසක ම සන්ධ්‍යාවෙහි හැංගුණේ ය.
(4) තරුණයා සැම දිනක ම සන්ධ්‍යා වේලාවෙහි සැඟවෙයි.

33. පහත දැක්වෙන ගීත ඛණ්ඩයේ අවසන් කොටස නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
ඇත්තෙ ඒ අභීත දූ පුතුන්
ජාතියේ නාමයෙන්
සංග්‍රාම භූමියේ

..............................

(1) වීරයන්ගෙ ඒ යශෝ ගීතයයි.
(2) එන්නෙ උන් හෙළූ ප්‍රාණ වායුවයි.
(3) ජීවිතේ පුදා හැළූ ලේ කඳයි.
(4) සාර වූ උදාර වූ මාතෘ භූමියයි.

34. 'ශූර අසරුවෙකු අසුන් මෙල්ල කරමින් විස්මයාවහ දක්ෂතාවන් විදහා දක්වන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ සිත විස්මයෙන් පුරවා දමමින් බස පාලනය කරයි'
ඉහත ප්‍රකාශයේ අදහස නිවැරදි ව කියැවෙන වාක්‍යය තෝරන්න.
(1) දක්ෂ අසරුවෙකු අසුන් මෙල්ල කරමින් පුදුමය උපදවන දස්කම් දක්වන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ බස හසුරුවන්නේ විස්මය දනවන අයුරිනි.
(2) දක්ෂ අසරුවෙකු විස්මයෙන් යුතුව අසුන් මෙල්ල කරන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයා විස්මයට පත් කරමින් බස හසුරුවයි.
(3) දක්ෂ අසරුවෙකු අසුන් මෙල්ල කරමින් විස්මය දනවන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද බස හසුරුවමින් පාඨකයාගේ සිත විස්මයට පත් කරයි.
(4) දක්ෂ අසරුවෙකු අසුන් මෙල්ල කරමින් විස්මය දනවන ලෙස දස්කම් දක්වන්නාක් මෙන්, නිපුණ සාහිත්‍යකරුවා ද පාඨකයාගේ සිත විස්මයට පත් වන ආකාරයට බස හසුරුවයි.

[පස්වැනි පිටුව බලන්න.

35. 'ඇතැ, මදින් වැනි මිය ඇත් රජයු, ඇතැ, සවණක් සන බුදුරැසින් නැදී මිය බුදුරජාණෝ යැ. ඇතැ, කෝපයෙන් රත් වූ මිය පවර වැනි ඇස් ඇති ඇත් රජයු, ඇතැ, කරුණායෙන් සෙත් වූ මිය නිල් මහනෙල් පෙති පරයන ඇස් ඇති බුදුරජාණෝ යැ...'
ඉහත වගයෙන් ඇති පාඨය අන්තර්ගත වන කෘතිය කුමක් ද?
(1) පූජාවලිය (2) බුත්සරණ
(3) අමාවතුර (4) සද්ධර්මරත්නාවලිය

36. "වෛද්‍ය විද්‍යාලයෙන් මට වැටුපක් ලැබෙනවා. එය මට ප්‍රමාණවත්. ජාතික භාෂාව පුනර්ජීවය මා සිතන හා පතන ආකාරයට ක්‍රියාත්මක කිරීමට ලැබුණොත් එය මට සතුටක්." මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) මහාචාර්ය කාලෝ ෆොන්සේකා (2) ආචාර්ය ඊ. ඩබ්. අදිකාරම්
(3) මහාචාර්ය සේනක බිබිලේ (4) මහාචාර්ය සෙනරත් පරණවිතාන

37. කෝට්ටේ අවධියේ දී රචනා කරන ලද සන්දේශ කාව්‍යයක් නොවන්නේ මින් කුමක් ද?
(1) සැලලිහිණි සන්දේශය (2) සැලලිහිණි සන්දේශය
(3) ගිරා සන්දේශය (4) මයූර සන්දේශය

38. "අතිගම්භීර ප්‍රපාතයෙහි වැටී ක්ෂුධාවෙන් පෙළී තෙඳිරිගාමින් හොත් පුරුෂයා දැක ..." යන පාඨයෙහි 'ක්ෂුධාවෙන්' යන්නෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) මහන්සියෙන් (2) නුසගින්නෙන්
(3) පිපාසයෙන් (4) බියෙන්

39. රූපකයක් ඇතුළත් වන උත්තරය තෝරන්න.
(1) ජීවන ගංගාව (2) මිය සතපුරු
(3) ඉඳුනිල් මිණි රුවනක් බඳු (4) දිසි රනලියෙව්

40. ධීවර වෘත්තිය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'මරක්කලාහේ' යනු
(1) ඇල් අදින පුද්ගලයා ය. (2) මරු අයිතිකරුවා ය.
(3) ධීවර කණ්ඩායමේ නායකයා ය. (4) මරුව පදවන පුද්ගලයා ය.

* *

smartlearner.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II**
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

---

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) පහත සඳහන් පිලි නියෝජනය වන ස්වර අක්ෂර ලියන්න.
 (අ) කෙටි පාපිල්ල
 (ආ) ගැට ඇලපිල්ල

(ii) පහත සඳහන් පද නිවැරදි ව සන්ධි කර ලියන්න.
 (අ) මිණි + අබරණ (ආ) නි + අවුල්

(iii) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
ගෝලීය වසංගත හේතු කොට ගෙන ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් විවිධ නව නිශ්පාදන වෙළෙඳපොලට එක් වී ඇත.

(iv) පහත සඳහන් වචනවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** නිවැරදි ව ලියන්න.
 (අ) කද (ආ) කඳ

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
 (අ) ඔවුහු විදේශිකයන් ය.
 (ආ) වෛද්‍යවරු රෝගීහු සුවපත් කරති.

(vi) "ඈ දෙමාපියන් **දැක** අත **වනමින්** ඉදිරියට ම දිව ගියා ය." යන වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය ලියන්න.

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද **දෙකක්** ලියන්න.
දර කපන්නා සුළඟින් ඉදිරී වැටුණු ගස ඉවත් කරයි.

(viii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
 (අ) කැඩුණු බිඳුණු දෙයක් නැවත සකස් කිරීම
 (ආ) ජලයෙහි හැසිරෙන

(ix) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
 (අ) නිශ්චිත (ආ) උපන්

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
 (අ) සංචාරකයන් විසින් ඇත්තු නරඹනු ලබති.
 (ආ) අප විසින් රෝහලට ඖෂධ තොගයක් පරිත්‍යාග කරන ලදි.

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** පහත දැක්වෙන **(අ). (ආ). (ඉ). (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** ශ්‍රී ලංකාව වර්ෂයේ මාස කිහිපයක් පුරා ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබෙන රටකි. කෘෂිකාර්මික කටයුතුවලට, ජල විදුලිය උත්පාදනය කිරීමට මෙන් ම පානීය අවශ්‍යතා සපුරා ගැනීමටත් මේ වර්ෂා ජලය ප්‍රයෝජනයට ගැනෙයි. වැසි නොලැබෙන මාසවල දී උග්‍ර ජල හිඟයකට මෙරට ජනතාවට මුහුණපෑමට සිදු වී ඇත්තේ වර්ෂා ජලය නිසි පරිදි සංරක්ෂණය කර ගැනීමේ වැඩපිළිවෙළක් නොමැති වීම හේතුවෙනි. එබැවින් වර්ෂා ජලය අපතේ යාමට ඉඩ නො තබා පසුව ප්‍රයෝජනයට ගැනීම සඳහා සුරක්ෂිත ව තබා ගැනීමේ විධිමත් ක්‍රියා පිළිවෙතක් පිළිබඳ අවධානය යොමු කිරීමට කාලය එළඹ තිබේ.

**(ආ)** ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් ව තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සෑම පුද්ගලයකුට ම පාහේ තම රට, ජාතිය සහ ආගම පිළිබඳ ව පවතින හැඟීම අමතක ව ගොස් ඇත. ශ්‍රී ලංකාවට ද මේ තත්ත්වය පොදු ය. ඊට පිළියමක් වශයෙන් තරුණ ප්‍රජාව තුළ දේශානුරාගය මතු කරවීමට සිදු ව තිබේ. ඒ සඳහා යොදා ගත හැකි විවිධ සාහිත්‍යාංග අතුරෙන් දේශානුරාගී ගීතවලට ප්‍රමුඛත්වයක් හිමි වේ. මේ අනුව ගුවන්විදුලිය සහ රූපවාහිනිය වැනි ජනමාධ්‍යවලින් ප්‍රචාරය කෙරෙන හරසුන් වැඩසටහන් වෙනුවට දේශානුරාගය දනවන ගීත ප්‍රචාරය කෙරෙන වැඩසටහන් ද ඇතුළත් කිරීම කාලෝචිත ය.

**(ඉ)** මිනිසුන්ගේ දෛනික පරිභෝජනයට ප්‍රමාණවත් පරිදි ඉන්ධන නොමැති වීම වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින ප්‍රබල අර්බුදයකි. මේ අර්බුදයට විසඳුම් සෙවීමේ දී ප්‍රමාණවත් ලෙස ඉන්ධන ගෙන්වා බෙදා හැරීම පිළිබඳ ව මෙන් ම අනවශ්‍ය ආකාරයට සිදුවන ඉන්ධන දහනය වැළැක්වීම පිළිබඳ ව ද අවධානය යොමු විය යුතු ය. නාගරික ප්‍රදේශවල පවතින අධික රථවාහන තදබදය අනවශ්‍ය ආකාරයට ඉන්ධන දහනය වීමට හේතු වී ඇති ප්‍රබල සාධකයක් බැවින් එය අවම කිරීමට ද පිළියම් යෙදිය යුතු ය.

**(ඊ)** අතීත මිනිසුන්ගේ කුසලතා හා කලාත්මක චින්තනය පිළිබිඹු කෙරෙන පුරාවස්තු සංරක්ෂණය කිරීම පිළිබඳ ලෝකයේ සෑම රටක් ම විවිධ ක්‍රමෝපායයන් අනුගමනය කරනු දැකිය හැකි ය. ලෝකයේ කිසිදු රටකට දෙවැනි නොවන තරමේ අනර්ඝ පුරාවස්තු සම්භාරයක් ශ්‍රී ලංකාවේ ද පවතී. නරඹන්නන්ගෙන් මෙන් ම සොර-සතුරන්ගෙන් ද මේ පුරාවස්තුවලට සිදුවන අලාභහානි පිළිබඳ ව මේ දිනවල ජනමාධ්‍ය නිතර ම තොරතුරු හෙළි කරයි. දැනට පවතින නීති-රීති ක්‍රියාත්මක කිරීමත් නව නීති-රීති සම්පාදනය කිරීමත් විවිධ උපක්‍රම භාවිත කරමින් මිනිසුන් තුළ ඒවා පිළිබඳ ඇල්මක් ඇති කරවීමත් මෙරට පුරාවස්තු සංරක්ෂණය කර ගැනීමට ඉවහල් වනු ඇත.

(ලකුණු 25 යි)

**3.** පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

19 වන සියවසේ දී ජනසන්නිවේදනය ලොව පුරා වඩාත් ප්‍රචලිත වන්නට විය. එමගින් නව සංස්කෘතියක් බිහිවන්නට වූ අතර එම සංස්කෘතිය වඩා වේගයෙන් ලොව පුරා ව්‍යාප්ත වන්නට වූයේ වඩාත් ජනප්‍රිය වෙමිනි. මෙහි ආරම්භක මාධ්‍යය වශයෙන් කටයුතු කළේ පුවත්පත යි. පුවත්පත මගින් ඇති කළ මේ නව සංස්කෘතිය විද්‍යුත් මාධ්‍යවල ප්‍රභවය සමග වෙනස් වූ අතර එම තත්ත්වය රූපවාහිනී මාධ්‍යය අත්කර ගන්නා ලද්දේ ග්‍රාහකයාගේ නිවසේ අනිවාර්ය මෙවලමක් බවට පත්වෙමිනි. ගුවන්විදුලි මාධ්‍යයේ ම දිගුවක් වශයෙන් බිහි වූ රූපවාහිනී මාධ්‍යය හුදකලා මාධ්‍යයක් ලෙස ගොඩනැගුණක් නො වේ. එය සිනමාව, නිශ්චල ඡායාරූපය හා ගුවන් විදුලි මාධ්‍යය ආශ්‍රයෙන් බිහි වූ මාධ්‍යයක් වේ. එහෙත් මේ සියලු මාධ්‍යයන්ට වඩා රූපවාහිනී මාධ්‍යය ග්‍රාහකයාට සමීප වූ අතර එය ගෘහස්ථ භාණ්ඩයක් බවට පරිවර්තනය විය. ඒ නිසා රූපවාහිනිය වඩා ප්‍රබල මාධ්‍යයක් වෙමින් ලෝකය පුරා ප්‍රචලිත විය.

රූපවාහිනී මාධ්‍යයේ ශක්‍යතා හා තාක්ෂණික ප්‍රවණතා පදනම් කර ගනිමින් රූපවාහිනියට දේශසීමා හඹා යාමේ හැකියාව අත් වූ අතර එයින් ලෝකය වඩාත් අන්‍යොන්‍ය වශයෙන් සමීප විය. සන්නිවේදන ක්‍රියාවලියේ දී වඩාත් ප්‍රබල මාධ්‍යයක් වීමට අවකාශය සලසා ගන්නා ලද්දේ එමගින් ය. අද්‍යතනයේ දී ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් ව ඇති අතර එකී විශ්ව ගම්මානයක ජනමාධ්‍යයක් වශයෙන් රූපවාහිනිය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් සිටියි. සීමා මායිම් අතික්‍රමණය කරමින් ගොඩනැගී ඇති මේ නව්‍ය වූ ලෝකයේ ජනතාවගේ දැනුවත් බව උදෙසා තොරතුරු සන්නිවේදනය කෙරෙන මාධ්‍යයක් වශයෙන් ද විනෝදාස්වාදන මාධ්‍යයක් වශයෙන් ද රූපවාහිනිය ඉතා වැදගත් සාධකයක් බවට පත් ව තිබේ.

(ලකුණු 10 යි)

[අටවැනි පිටුව බලන්න.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

ළමා සාහිත්‍යයේ අරමුණ විය යුත්තේ සාහිත්‍ය කටයුතු අනුසාරයෙන් නිරවද්‍ය චින්තනයෙන් ප්‍රභාවිත විවිධ විෂයයන් හා විපුල ක්‍රමයන් පිළිබඳ සාරගර්භ ශික්ෂණයක් හා නිර්මාණ ක්‍රියාවේගයන් ජනනය කෙරෙන ශික්ෂණයක් කරා බාල පරපුර මෙහෙයවීම යි. අස්වාභාවික නොවන සේ රචිත විධිමත් ළමා සාහිත්‍ය කෘති මගින් ළමා මනස මිථ්‍යා විශ්වාස හා කල්පිත ලෝක කරා ඇදී යාම වළක්වාලීමට සැලකිය යුතු පිටුබලයක් සපයයි. මූලික වශයෙන් වර්ග දෙකකට බෙදෙන ළමා සාහිත්‍ය කෘතිවලින් එක් වර්ගයක් සෞන්දර්යාවබෝධය හා වින්දනය ලබා දීමේ කරණීය ආකල්ප තහවුරු කරයි. අනෙක් වර්ගය ළමයා අවට ලෝකයේ පවතින විවිධ ධර්මතා පිළිබඳ අවබෝධය ලබා දෙයි.

ළමා ලෝකයේ පවතින රසවත් සංකල්පනා පදනම් කර ගැනුණු රචනා කියවීමට ළමයින් තුළ පවතින්නේ බලවත් ආශාවකි. ජනකතා, ජන ගී, ජන කාව්‍ය ආදි ජනශ්‍රැති අංග කෙරෙහි ද ස්වකීය ආගමික සිතුම්-පැතුම් හා ප්‍රතිඥාවන් වස්තු බීජ කර ගත් සරල නිර්මාණ කෘති කෙරෙහි ද ළමා රුචිය ඉස්මතු වෙයි. ස්වභාවධර්මයේ විවිධාංග, විද්‍යාංශ, ඓතිහාසික වෘත්තාන්ත හා තත්කාලීන සිදුවීම් යනාදි විෂයයන් පිළිබඳ ව ළමා මනස මෙහෙයවීමට සූක්ෂ්ම ලෙස නිර්මාණය කෙරෙන කෘති යොදා ගත හැකි ය. දියුණු ළමා සාහිත්‍යයක් පවතින රටවල ස්වභාව විද්‍යාව හා සමාජ විද්‍යාව පිළිබඳ මූල දැනුමක් ලබා දෙමින් රචිත පොත්වලට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. එම කෘති මගින් ළමයින්ගේ චින්තන ශක්තිය පුළුල් වේ. ස්වභාවධර්මය පිළිබඳ විමසිල්ලෙන් පරීක්ෂා කොට, එය අබිබවා ක්‍රියා කිරීමේ හැකියාව වර්ධනය වේ. ලෝකයේ සැම රටක ම වෙසෙන ළමයින් සාමාන්‍යයෙන් ඒකාකාර වුව ද ඔවුන් සඳහා ලියැවෙන කෘති රටින් රටට වෙනස් වේ. එසේ වෙනස් වන්නේ විවිධ චර්යාවන් හා ඒවායේ ප්‍රතිඵලවලින් ගොඩනැගී ඇති පුරුෂාර්ථ ගැබ්කොට ගත් සංස්කෘතික රටාවේ බලපෑම නිසා ය. මේ අනුව විමසිලිමත් වන විට බටහිර රටවල ළමා සාහිත්‍ය කෘතිවලට වඩා ලංකාවේ ළමයින්ට ආසියාතික රටවල නිර්මාණය වූ කෘති ප්‍රියජනක වන බව පෙනේ.

ළමා සාහිත්‍ය කෘතීන්හි භාෂාව කෙරෙහි ද අපගේ අවධානය විශේෂයෙන් යොමු විය යුතු වේ. ළමයින් කතා කරන භාෂාව ග්‍රන්ථ භාෂාවට වඩා ප්‍රාණවත් ය. මුල් අවධියේ ළමයින් සඳහා ලියැවෙන පොත් ළමා ව්‍යවහාරානුසාරී වූ ද මානසික පරිසරයට අනුකූල වූ ද භාෂා ස්වරූපයෙන් යුක්ත විය යුතු ය.

(i) ළමා මනස මිථ්‍යා විශ්වාස හා කල්පිත ලෝක කරා ඇදී යාම වැළැක්වීමට උපකාරී වන්නේ කවර වර්ගයේ කෘති ද?

(ii) මේ ඡේදයේ දැක්වෙන ජනශ්‍රැති අංග මොනවා ද?

(iii) ළමා මනස මෙහෙයවීමට සූක්ෂ්ම ලෙස නිර්මාණය කෙරෙන කෘති සඳහා යොදා ගත හැකි විෂයයන් **දෙකක්** නම් කරන්න.

(iv) දියුණු ළමා සාහිත්‍යයක් පවතින රටවල විශේෂ අවධානයක් යොමු වන්නේ කවර වර්ගයේ කෘති කෙරෙහි ද?

(v) මුල් අවධියේ ළමයින් සඳහා ලියැවෙන කෘතිවල භාෂා ස්වරූපය කෙබඳු විය යුතු ද?

(ලකුණු $02 \times 5 = 10$ යි)

**5.** පහත දැක්වෙන තොරතුරු පදනම් කරගෙන **දැන්වීම් පත්‍රිකාවක්** සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

**'උදාර'** යනු පෞද්ගලික කර්මාන්තායතනයක සේවක සුභසාධක සංගමයකි. එහි මාසික රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡා කෙරිණි.

- තම සංගමය මගින් සමාජ සත්කාර සේවා රැසක් සිදු කරන බව
- වාර්ෂික ලේ දන් දීමේ කඳවුර 2022 වර්ෂයේ ද සංවිධානය කළ යුතු බව
- එය දෙසැම්බර් 20 දින සිදු කළ යුතු බව
- ලේ දන් දීමේ කඳවුර සඳහා කර්මාන්තශාලාවේ සේවක විවේකාගාරය සූදානම් කළ යුතු බව

උදාර සුභසාධක සංගමයේ ලේකම් 'දේවිකා අබේරත්න' ඔබ යයි සිතන්න.

**නැතහොත්**

පහත සඳහන් විස්තරය පදනම් කරගෙන **රාජකාරි ලිපියක්** සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

**'සමගිපුර'** ග්‍රාම සංවර්ධන සමිතියේ මෙවර රැස්වීමේ දී පහත සඳහන් කරුණු සාකච්ඡාවට භාජනය විය.

- සමගිපුර ගම මැදින් වැටී ඇති දුම්රිය හරස් මාර්ගය අනතුරු බහුල ස්ථානයක් වී ඇති බව
- දුම්රිය ගේට්ටුවක් නොමැතිකම මීට ප්‍රධාන හේතුව වී ඇති බව
- මේ වන විටත් ජීවිත හානි කිහිපයක් ම සිදු ව ඇති බව
- දුම්රිය ගේට්ටුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දුම්රිය අධිකාරිවරයාගෙන් ඉල්ලීමක් කළ යුතු බව

සමගිපුර ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් 'රසික ආරියරත්න' ඔබ යයි සිතන්න.

(ලකුණු 15 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

සිංහල භාෂාව හා සාහිත්‍යය III
சிங்களமொழியும் இலக்கியமும் III
Sinhala Language and Literature III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) දුරුතු මහේ දී කැලයට වැදිලා
............................................ ...........
මැදින් දිනේ දී වල් ගිනි තබාලා
සුරහන් ඉසිඹුව කළුවර බලාලා

**(අ)** මෙම කවියේ දෙවන පදය සම්පූර්ණ කරන්න.
**(ආ)** ජනවාරි මාසය හැඳින්වීමට කවියේ යෙදී ඇති වචනය කුමක් ද?

(ii) ස න් ත න් සිහින් ගෙඩි සෙවණලු වැලි තෙලෙන
තැ න් තැ න් වල ම සැතැපී සියුමැලි බැවින
ර න් ව න් කරල් ගෙනැ එන ගිරවුන් අතින
**ය ත් ම ත් තොසින් මග තොරතුරු කියම දැන**

**(අ)** මෙම පද්‍යය ඇතුළත් කෘතිය කුමක් ද?
**(ආ)** තද කළ අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අදහස ලියන්න.

(iii) "ඔව්! හැමදේම බැන්! බැන්! කට විතරයි හොල්ලන්න පුළුවන්. අතක් හොල්ලන්න එපා!"

**(අ)** මෙම ප්‍රකාශය කළ අයගේ නම කුමක් ද?
**(ආ)** මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව ලියන්න.

(iv) ඇසේ කඳුලැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ

**(අ)** මෙම පද්‍යය ඇතුළත් පැදි පෙළෙහි රචකයා කවරෙක් ද?
**(ආ)** පුංචි පුතා රජ කරනු පෙනෙන්නේ කවර අවධියක ද?

(v) "ගං ඉවුරේ අලි ඇට නරි අඳිනවා කියලා අනිත් අලි ගහේ නාන්නේ නැතුව අරිනවා ද?"

**(අ)** මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?
**(ආ)** මෙම ප්‍රකාශය හා සබැඳුණු අවස්ථාව කුමක් ද?

(vi) "තොල පවිටු දූෂ්‍ය අපවිත්‍ර වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු හෙල්ල"

**(අ)** මෙම ප්‍රකාශය [illegible] කෘතිය නම් කරන්න.

(vii) "අපි ආපු පාර දිගේ ආපහු පයින් ම මං යන්නම්" යි ඔහු කී ය. "පයින් ම ගිහිල්ලා සොයා ගන්න පුළුවන් ද කියලා බලන්නම්"

(අ) මෙම කොටස උපුටා ගත් නිර්මාණයේ මුල් රචකයාගේ නම ලියන්න.

(ආ) මෙහි සඳහන් තැනැත්තා සොයා ගැනීමට උත්සාහ කළේ කුමක් ද?

(viii) "තමන් පාහා කෙළි තමන් ම දන්නා පමණ මුත් රජ පුරුවන් නො බලන නියාව දැන මුසුප්පු ව හොයින්"

(අ) මෙහි 'තමන්' යනුවෙන් හැඳින් වූ අයගේ නම කුමක් ද?

(ආ) රජ වූ පිරිස බලා සිටියේ කවුරුන් දෙස ද?

(ix) (අ) හංස සන්දේශය රචනා වී ඇත්තේ කවර යුගයක ද?

(ආ) හංස සන්දේශය මගින් සෙත් පැතීමට අපේක්ෂා කෙරෙන්නේ කිනම් රජකුමාට ද?

(x) (අ) සිංහල භාෂාවෙන් ලියැවී ඇති පැරණි විනය ග්‍රන්ථයක් නම් කරන්න.

(ආ) කුස ජාතක කාව්‍ය ග්‍රන්ථයේ රචකයා කවරෙක් ද?

(ලකුණු 02 × 10 = 20 යි)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කැර එකසී
අහසින් බැස රඟ ගත් රඟ කෙලෙසී
දිසි මෙන් විය විදුලිය සිය දහසී

(අ) මෙහි දැක්වෙන උපමාව කුමක් ද?

(ආ) පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.

(ii) කිම ද මැණියනි ඔබ මේ
පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේ ය
ඇසෙන මෙ අරුමා

(අ) මැණියන් තම දරුවන් අමතා පවසන්නට යෙදුණු කාරණය කෙටියෙන් ලියන්න.

(ආ) මැණියන්ගේ ප්‍රකාශයෙන් අනතුරුව සිංහබාහු ක්‍රියා කළ ආකාරය කෙබඳු දැයි විස්තර කරන්න.

(iii) "මහතෙරුන් කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්හු ඔවුන් දැකැ වෙවුලත් මැ යැ. පලත් මැ යැ. දොරපියා-ලත් මැ යැ. ඇතැම්හු අඟුල්මල් නම අසමින් පලා වලට හො වදිති. ගෙට වැදැ දොර පියා-ලා අගුළු හො ගන්ති. පලා නො යා හෙන්නාහු පිට පෑ සිටුති. මහතෙරණු **සරළුවක්** හම්බු දු කෙණෙස්සක් මතු දු නො ලැබෙති."

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) අඟුල්මල් තෙරුන් දුටු මිනිසුන් හැසුරුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iv) නොයෙක් තැන ම පිපි මල් පිරුණු **පොකුණුය**
ගෙයක් කන ම සැදැහෙන් දෙවන **දකුණුය**
පුදක් ලෙස තිබෙයි මළු මං හැර **කුණුය**
සියක් අය කෙරෙති වැඳ පුද **පැදකුණුය**

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) පරිසරයේ සුන්දරත්වය හා මිනිසුන්ගේ ක්‍රියාකලාප ගැන කවියා දක්වා ඇති තොරතුරු මොනවා ද?

(v) "සිංහ නාද ඇසූ මුව පොල්ලන් පරිද්දෙන් තොපගේ අහිත ශබ්දයෙන් ම උන් භය ගන්වා යමුඟුරු බා ලා සියලු රා මස් පිරූ සැලවල් බිඳ තු තු කොට පියා වහා රා මස් අවුළු විසුරුවා නො කැ හැකි පරිද්දෙන් කොට දිව්මෙන් ගොස් සේනා මධ්‍යයට වැද, ශක්‍ර පුරයට වන් අසුර භටයන් පරිද්දෙන් මහත් අරගල කොට, 'අපි මියුලු නුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ යෝධයම්හ. පිළිවන් වී නම් අප අල්ලා ගනුව' යි තොප හිය බව හඟවා එව".

(අ) මෙම පාඨයේ දැක්වෙන උපමා **දෙක** උපුටා ලියන්න.

(ආ) මහෞෂධ පණ්ඩිතයන් යෝධයන්ට මෙලෙස උපදෙස් දීමට හේතු වූ කාරණය කෙටියෙන් ලියන්න.

3. • චූලනී බ්‍රහ්මදත්ත රජුගේ චරිතයත්
• වෛදේහ රජුගේ චරිතයත්

උම්මග්ග ජාතකයේ නිරූපණය කර ඇති ආකාරයෙන් ස්ඵුට වන්නේ රාජ්‍ය පාලනයේ දී කෘතහස්ත උපදේශකයන්ගේ සේවයේ අවශ්‍යතාව යි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

• භාෂාව සුමට ලෙස හසුරුවා ගැනීම
• අවස්ථෝචිත ලෙස සිද්ධි පෙළ ගැස්වීම මගින්

ගුත්තිල කවියාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය පිළිබිඹු කෙරෙයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

4. • අජීව වස්තූන්ට සජීව ස්වරූපය ආරෝපණය කිරීමත්
• උචිත බස් වහරක් යොදා ගැනීමත්

'වස්සානය' කවි පෙළෙහි සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

• ගැමි බස්වහරක් යොදා ගැනීමත්
• සිද්ධි හා අවස්ථා මනා ලෙස ගැළපීමත් නිසා

'අපට වැසිකිළියක්' කෙටිකතාව පාඨක ආකර්ෂණය දිනා ගැනීමට සමත් ව ඇත.
එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

• **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. බැද්දේගම නවකතාවෙන් නිරූපණය වන්නේ නූගත් ගැමි ජනතාවගේ අව්‍යාජ සිතුම් පැතුම් ය. නිර්දිෂ්ට කොටස ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

6. අඟුල්මල් දමනයෙහි දැක්වෙන දිසාපාමොක් ඇදුරු චරිතය මගින් විදහා දැක්වෙන්නේ ද අර්බුද හමුවේ මිනිස් සිත ක්‍රියා කරන සාමාන්‍ය ස්වභාවය යි. අමාවතුර නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

7. මිනිස් දිවිය සහ සොබා දහම සංකලනය කරමින් ජීවන දර්ශනයක් මතුකොට දැක්වීමට කවියා ගෙන ඇති උත්සාහය කෙතෙක් දුරට සාර්ථක වී ඇද්ද යි 'ගංගාවේ සංගීතය' පැදිපෙළ ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

* * *

smartlearner.lk